# මුතු කරාබුව

තරංග ජයසේන





## අයන්නෙන් "අම්මා". ආයන්නෙන් "ආදරය".

මේ වියමන ඔබ ඇතුළේ ඉදිකරන්නට මහත් වෙහෙසක් ගන්නට සිදුවෙන බව ආරම්භයේදීම මට දැනේ. ඔබේ කුටියේ හෝ කොහේ හෝ සැඟව කියවන්නට හැකි තැනක් අපිට අවශ්‍යය.

දැන් අපි එතැනට යමු. ඔබට මවා ගන්නට පුළුවන්ද ගහ කොලින් වට වූ පුංචි දිය පාරක්. හතර වටින්ම ආවරණය වූ ටිකක් හයියෙන් වතුර ගලාගෙන යන තැනක්. එන්න අපි හෙමින් වතුරට බහිමු. අන්න අර පේනවද දොළ මැද්දෑවෙ තියන ගල් දෙබුක්කාව. යමු. පීනගෙන ගිහින් එතනින් මතු වෙලා ගල් දෙබුක්කාවට හිස තියාගෙන ලිහිල් ඉරියව්වකින් දිය පාරේ වැතිරෙමු. දැන් ඔබ බලාගෙන ඉන්නේ නිල් පාට අහස දිහාවේ. තදින් ඉර පායලා. ඔබේ හිස දෙපැත්තෙන් වතුර ගලාගෙන යනවා. මුහුණ විතරක් ඉතුරු වෙන්න ඔබේ සිරුර මතින් දොළ පාර ගමන් කරනවා.

හැම දේම අමතක වෙන්න කලියෙන් මං එකක් කියන්නද? අපි මේ හදන්නේ අම්මා ගැන හිතන්න. පියා ගත්තු ඇස් ටිකක් රිදෙයි ඉර එළිය වැටෙද්දි. ඒත් හෙමින් ඇහුම්කන් දෙන්න ඔබේ කණ ළඟින් වතුර බැහැගෙන යන සද්දේ. මෙතනින් එහාට මං හරි අසරණයි. ඔබව ඈ ළඟට ගෙනියන්න මට තනියෙන් බැරි වෙයි. දොළේ දිය පහරේ සංගීතය සමග ඒකාත්මික වෙන ගීයක් ඔබට කෙමෙන් ඇහෙනවා.

මිහි මඬලේ අඳුරු කුසේ දිය උල්පත අම්මා
අහස් තලෙන් මරු කතරට වහින වැස්ස අම්මා
නිල් දෙරණේ තුරු ලිය මත මල් සම්පත අම්මා
තුරු ලිය මත පිපි කුසුමේ ඵල සම්පත අම්මා

සිය දහසක් නෙක ලෝ දා එළිය කරන අම්මා
සොළොස් කලා පිරි පුර හඳ එළිය කරන අම්මා
මිහි මඬලේ අඳුරු කුසේ දිය උල්පත අම්මා
අහස තලෙන් මරු කතරට වහින වැස්ස අම්මා

සඳ නැති රෑ සක්වල තරු එළිය කරන අම්මා
උදා ගිරෙන් ලොවට වඩින ලහිරු මඬල අම්මා
මිහි මඬලේ අඳුරු කුසේ දිය උල්පත අම්මා
අහස තලෙන් මරු කතරට වහින වැස්ස අම්මා

ඔහොමම ඉන්න.

දෙයියනේ ඔබට ඈ පේනවාද? ඔබට දැනෙනවා ද ඔබ ඉන්නේ ඈ ඇතුළේ- ඇගේ ගැබ ඇතුළේ නේද? වතුර පිරුණු බෑගයක? අඳුරු, සීතල එහෙත් උණුසුම් තැනක? හැම දේම නැවතිලා. ඔබට ඇහෙනවාද ටිකක් දුරින් ඇගේ හදවත ගැහෙන සද්දේ? හොඳට ඇහුම්කන් දෙන්න. ඇහෙනවද?

අපි මොකුත් නොකර ටිකක් ඉමුද? (මට මේක ලියන්න බැහැ- ඔව්. මට ඒක ඇහෙන්න ගත්තා! ටිකක් ඉමු. හරි යයි...!)

හරි. ඒක ටිකාක් ඕවර් ගියා වගේ. මං වෙන තැනකින් රිංගන්නම්.

ඔබ ඉන්න දිගටම හිස තියාගෙන ගල් දෙබක්කාවට.

ඇත්තටම අපි මේ හෝඩි පොත වෙනස් කරන්න ඕනේ. "අ"යන්නෙන් "අම්මා" ගාවට "ආ"යන්නෙන් "ආදරය" එන්න ඕනෙ. ඒ අළුත් හෝඩි පොත අපේ දරුවන්ට දෙන්න ඕනෙ. උන් දැන ගන්න ඕනේ අම්මා කියන්නේ ආදරයම මිසක් වෙන දෙයක් නොවෙන බව. නැත්නම් ළඟදිම උන්ට අම්මව කිරි පිටි පෙට්ටියක් වගේ හරි ජෑම් බෝතලයක් වගේ හරි චීස් ටින් එකක් වගේ හරි පේන්න ගනියි.

ඇත්තටම අපි මේ හෝඩි පොත වෙනස් කරන්න ඕනේ. "අ"යන්නෙන් "අම්මා" ගාවට "ආ"යන්නෙන් "ආදරය" එන්න ඕනෙ. ඒ අළුත් හෝඩි පොත අපේ දරුවන්ට දෙන්න ඕනෙ. උන් දැන ගන්න ඕනේ අම්මා කියන්නේ ආදරයම මිසක් වෙන දෙයක් නොවෙන බව. නැත්නම් ළඟදිම උන්ට අම්මව කිරි පිටි පෙට්ටියක් වගේ හරි ජෑම් බෝතලයක් වගේ හරි චීස් ටින් එකක් වගේ හරි පේන්න ගනියි.

ඔබට පේනවද- අන්න අම්මා ඔබ දිහා බලන් ඉන්නවා- ඔබ මොන විදිහේ කෙනෙක් වුනත් ඈට ඔබව පේන්නේ පොඩි දරුවෙක් වාගේ. ගැබ ඇතුළෙ ඉඳන් දඟ කරපු, එළියට ආපු ගමන් බෙරිහන් දීපු- ඇඟ ලෙය කිරට පෙරලන්නට තරම් ආශ්චර්යමත් ආදරයක් ඇති කළ ළදරුවා වාගේ. ඒකයි ඈ අපි වෙනුවෙන් අඬන්නේ. ඒකයි ඈ අපි එනකල් ඉදිකඩ ළඟ මග බලන්නේ. අපිට හැම දේකින්ම පලා යන්න පුළුවන්. ඒත් ඈ බලන් ඉන්නවා- ඔව්. මුළු ලෝකයේම අම්මලා හැම මොහොතකම දරුවන් ගෙදර එනතුරු බලන් ඉන්නවා. ජීවිතයට අප කැඳවන- කිසිදිනෙක කිසිවෙකුට විස්තර කළ නොහැකි අපරිමිත ආදරය සමගින් බලන් ඉන්නවා. මේ දැන්- මේ දැන් ඔබ ඇවිත් කඩුල්ල පනිතැයි බලන් ඉන්නවා. ඇහුණද ඒ ටික ඔබට?

මිනිසුන්ගේ ජීවිත වටින්නේ ඒකයි. ඒ හැම ජීවිතයකම අද්දර පපුවේ ගින්දර දල්වගෙන මග බලන අම්මෙක් ඉන්නවා. ඒ ගිනි රස්නෙ අඳුනන කිසිම කෙනෙකුට තව කෙනෙක්ගෙ ජීවිතවල වටිනාකම අමතක කරන්න බෑ. ලෝකෙ පුරා කුසගින්නෙන් යුද්ධයෙන් සහ නොයෙක් අකල් විපත් වලින් මියයන දරුවන් වෙනුවෙන් අම්මලා අඬනවා. හැම මොහොතකම අඬනවා! ඒ කඳුළු වර්ග කරන්නේ පාහර බල්ලෝ!

අපි දැන් ගොඩට එමු. එන්න. මෙන්න මෙතන හරි හෙවණයි. කුඹුක් ගහක්ද? ඒ වගේ. මෙතන බිම ඉඳගෙන කලින් අපි උන්නු තැන දිහාවේ බලන් ඉඳිමු.

හිතන්න. අපි කිසිම තේරුමක් නැති අරමුණු පස්සෙ බල්ලො වගේ හති දදා දුවනවා. සීමාවක් නැති නිසරු දේ ලුහු බඳිමින් අපේ ජීවිත වල වටිනාම දේ වන ආදරය කිරීම අමතක කරලා දාලා... ෂික් පිස්සුවක් මේක- පිස්සුවක්....! ඒත් ඩිංගක් නැවතිලා හිතන්න. ඔබ මොහොතකට පෙර අර ගල් දෙබුක්කාවෙදි ආයෙම ඉපදුනා නේද?

අම්මා ගැන ඔබට මතක තියෙන දුරම සිදුවීම මොකද්ද? මතකද? පොඩ්ඩක් හිතමු අපි. සමහරක් ඒවා වර්ණ බොඳ වුනු සිත්තම් වගේ නේද? ඒත් ඒ සිතිවිලි හරිම උණුසුම් බව ඔබට හිතෙන්නැද්ද? මන්දා. මට ඇහෙන්නේ නෑ ඔබ කියන දේ. ඒත් මම මේ දැන් ලියන ගමන්ම මගේ පරිගණකයෙන් අම්මා ගැන අපි අහල තියන අපූර්වතම ගීය වාදනය කරනවා. ඔබ ඉන්න තැනම වැලි පොළවේ වැතිරිලා අහගෙන ඉන්න.

දවසක් පැල නැති හේනේ - අකාල මහ වැසි වැස්සා
තුරුළේ හංගාගෙන මා - ඔබ තෙමුණා අම්මේ
පායන තුරු හිටි පියවර සිටියා නුඹ අම්මේ

නුවර වීදි යටකරගෙන - නින්දා වැහි වැගිරුනු දා
බිරිඳකගේ සෙනෙහෙ ගියා - යෝධ ඇලේ නැම්මේ
ඔබෙ සෙනෙහස සුවඳ දිදී දැනුනා මට අම්මේ

කොළඹ අහස කළු කරගෙන - මූදු හුළඟ හඬලනකොට
ඔටුන්න බිම දා දුවගෙන - එන්නද එක පිම්මේ
මං එනතුරු ඉදිකඩ ළඟ ඉන්නවාද අම්මේ

ඔබට හිතෙන් එතැනට යන්න පුළුවන්ද? අම්මා ඔබ තුරුළු කරන් උන්නු මොහොතකට? සමහර විටෙක ඈ ඔබට කවා පොවා බඩගින්නේ ඉන්න ඇති. ඔබ අසනීප වූ විටෙක නිදිවර්ජිතව රෑ පහන් කරන්න ඇති. ඇගේ සියළු දුක් පීඩා සඟවාගෙන ඔබ නිදිකරවන්නට හිස පිරිමදිමින් කතන්දරයක් කියන්න ඇති. ආයෙමත් ඇස් පියාගෙන අහගෙන ඉන්න පුලුවන්ද? ඇගේ හදවත ගැහෙනවා. ඇහෙනවද ඈ හයියෙන් හුස්ම ගන්නවා. අම්මාව බලා ගන්න. ඇස් දෙක වගේ. ඈ ඇඬුවා ඇති. ඈට අඬන්නට දෙන්න එපා. අනේ ඔව්. ඈට ඔබව ඕනේ හුඟක්. හුඟක්. හුඟාක්!

හලෝ මේ, දැන් මේක මං නවත්තන්නද?
(ආන්න අපේ අම්මා එනවා දෙවට දිගේ කන්ද නැග ගෙන ඇත. දැන් ඇවිත් මොකාක් හරි එකක් කියයි ඉණට අත් දෙක තියා ගෙන...!)

---

*ගීත පිළිවෙලින් නන්දා මාලනී සහ කපුගේ ගැයූ ඒවා.*

ශ්‍රී ලාංකික ඔබේ රියදුරු පාසල



Ravin රවින්
*Professional / Patient Instructor*
*Easy Learning Techniques*
*Exceptional Pass Rate*

Iyoka Driving School
Training Excellence

Tel : 94021196
Mobile : 0433028029
iyoka_ds@yahoo.com.au

AAK Electricals

- All Type of Electrical Work
- Split Air Con Installations
- Security Alarms

*For friendly and reliable service*

Kingsly Perera
Tel/Fax 9457 2307
Mob 0414 412 954

Rec 17466